**සේවක අර්ථසාධක අරමුදල - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

සේවක අර්ථසාධක අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණිත නිරීක්ෂණ

-----------------------------------------------------------------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

--------------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනා ලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51ඡේදය අනුව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කල යුතුවුවත් අරමුදල ඒ අනුව කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ක්ෂය ගණනය කිරීමේ උපලේඛනය අනුව, සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ වත්කම් වටිනාකම මුදල් මණ්ඩලය හා කම්කරු දෙපාර්තමේන්තුවට අදාලව පිළිවෙලින් රු.මිලියන 138.70 ක් හා රු.මිලියන 461.11 ක් විය. එම වත්කම් අතරින් තවදුරටත් භාවිතා කරනු ලබන වත්කම් හඳුනාගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය නිවැරදිව සමාලෝචනය නොකිරීමෙන් සිදුවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව නිවැරදි කිරීමටත් තවදුරටත් භාවිතයට ගනු නොලබන වත්කම් සුදුසු පරිදි අපහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි. | මෙම ස්ථාවර වත්කම් සම්බන්ධ ගැටලු සඳහා විසඳුම් ලබාගැනීමේ අරමුණින් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතින අතර කොවිඞ් - 19 ව්‍යාප්තිය හා රට තුළ දැනට පවතින ආර්ථික අර්බුදය හමුවේ එම කටයුතු අපේක්ෂිත පරිදි සිදුකිරීමට නොහැකි විය. | ප්‍රමිතිය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සම්බන්ධයෙන් කටයුතු කලයුතු විම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් 2021 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද බැංකු ගිණුම් 08 කට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව 2001 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ පහත විස්තර දැක්වෙන හඳුනා නොගත් ගනුදෙනු නිවැරදි කිරීමට හෝ නිරාකරණය කිරීමට අදාල පියවර නොගෙන දිගින් දිගටම බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි දක්වා තිබුණි. | | |
| (i) | 2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් අගරු වූ චෙක්පත්, බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ ගනුදෙනු, මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු, ඍජු හර/බැර හා හඳුනා නොගත් අනෙකුත් ශේෂ ලෙස එකතුව රු.මිලියන 13,316.08 ක් පැවති අතර ඉන් රු.මිලියන 11,103.61 ක් 2022 මැයි 31 වන විටත් නිරවුල්කර නොතිබුණි. | බැංකු ප්‍රකාශනයේ සහ මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු නිරවුල් නොවීමට හේතු වී ඇත්තේ බැංකු ප්‍රකාශනයේ සහ මුදල් පොතේ සටහන් වූ අගයන්ගේ වෙනස්කම් හඳුනා ගැනීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති වීමයි. ඍජු හර හා බැර ගනුදෙනු නිරවුල් නොවීමට හේතු වී ඇත්තේ එම ගනුදෙනු වලට අදාල මුදල් පොතෙහි ඇති සමහර යොමු අංක බැංකු සැසඳුම් පවතින අදාල දිනට ඇති යොමු අංක සමඟ නොගැලපීමයි. | අඟරු වූ චෙක්පත්, බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ ගනුදෙනු, මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු, ඍජු හර/බැර හා හඳුනා නොගත් අනෙකුත් ශේෂ කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම |
| (ii) | 2021 දෙසැම්බර් 31 දිනට තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇණවුම්, උපලබ්ධි නොවූ චෙක්පත් හා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් එකතුව රු.මිලියන 2,322.59 ක් පැවති අතර ඉන් රු.මිලියන 715.70 ක් 2022 මැයි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇනවුම් වලින් රු.මිලියන 66.57 ක්ද, තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්වලින් රු.මිලියන 843.54 ක්ද, නිකුත් කල නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් වලින් රු.මිලියන 696.78 ක් ද, 2022 මැයි වන විට නිරවුල් කර ඇත. | බැංකු සැසඳුම් ප්‍රකාශවල ඇතුළත් බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ ගනුදෙනු කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතු වීම. |
| (iii) | අරමුදල විසින් භාවිතා කරන පරිගණක ගිණුම්කරණ පද්ධතියේ දෝෂයක් ලෙස 2006 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.මිලියන 141.32 ක් වූ හර ශේෂය නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය එක් ගිණුමකට අදාල වන අතර එය 2006 සිට 2007 වර්ෂයට අදාළව බැංකු ප්‍රකාශයේ ඇති ගනුදෙනු කිහිපයක් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙළ | නිරවුල් කර නොමැති බැංකු ශේෂ කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | කිරීමේ දී මගහැරීම හේතුවෙන් ඇතිවූවකි. 2006 හා 2007 වර්ෂවලට අදාළව පවතින වෙනස්කම් සඳහා අදාළ ගිණුම්ගත කිරීම් සිදුකරන අතර, එමගින් එම ශේෂය ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට හැකි වනු ඇත. | |
| (ආ) | අරමුදලෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය ප්‍රකාරව මෝටර් රථ වාර්ෂිකව සරල මාර්ග ක්‍රමය යටතේ සියයට 20 බැගින් ක්ෂය කල යුතු වේ. 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව (කම්කරු දෙපාර්තමේන්තුවට අදාලව) මෝටර් රථ පිරිවැය රු.මිලියන 97.20 ක් වූ අතර ක්ෂය ගණනය කිරීමේ ලේඛන අනුව සම්පූර්ණයෙන් ක්ෂය කල මෝටර් රථවල පිරිවැය රු.මිලියන 36.22 ක් විය. ඒ අනුව පිරිවැය රු.මිලියන 60.98 ක් වූ මෝටර් රථ සඳහා ක්ෂය වීම් ගණනය කල යුතු වුවද 2020 හා 2021 වර්ෂ සඳහා ක්ෂය වීම් ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ස්ථාවර වත්කම් සම්බන්ධ ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීමේ අරමුණින් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතින අතර කොවිඩ් - 19 ව්‍යාප්තිය හා රට තුළ දැනට පවතින ආර්ථික අර්බුදය හමුවේ එම කටයුතු අපේක්ෂිත පරිදි සිදුකිරීමට නොහැකි විය. | අරමුදලෙහි ස්ථාවර වත්කම් ක්ෂය වීම් ප්‍රතිපත්තිය අනුව ස්ථාවර වත්කම් ක්ෂය ගිණුම්ගත කළ යුතු වීම |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.මි) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.මි) | වෙනස (රු.මි) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | දේපළ, පිරියත හා උපකරණ | 1,034.75 | 574.27 | 460.48 | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතින අතර කොවිඩ් - 19 ව්‍යාප්තිය හා රට තුළ දැනට පවතින ආර්ථික අර්බුදය හමුවේ එම කටයුතු අපේක්ෂිත පරිදි සිදුකිරීමට නොහැකි විය. | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම අදාල සියලුම උපලේඛන අනුව ද තහවුරු වන පරිදි නිවැරදි සංඛ්‍යා දත්ත සහ තොරතුරු පවත්වා ගැනිම. |
| (ආ) | සාමාජික අරමුදල තුල ඇතුලත් ගිණුම් 5 ක ශේෂය | 85,362 | 42,580 | 42,782 | 'AS/400' පද්ධතිය තුල මුදල් පදනමින් (Cash basis) ගනුදෙනු වාර්තා කරනු ලබන අතර පොදු ලෙජරය තුල ගනුදෙනු වාර්තා කරනුයේ උපචිත පදනමිනි (Accrued basis). මේ නිසා මෙම පද්ධති දෙකෙහි කිසියම් දිනෙක පවතින ශේෂයන්හි වෙනසක් ස්වාභාවිකවම ඇති වේ. මෙම වෙනස සඳහා වන සැසඳුමක් සැකසීම 2017 වර්ෂයෙහි සිට | අදාල සම්පූර්ණ වෙනස දැක්වෙන පරිදි සැසඳුම් ප්‍රකාශ සකස් කිරීම. |

ක්‍රියාත්මක වන අතර ඊට පෙර වසරවලදී එවැනි සැසඳුමක් සකස්කර නොතිබීම හේතුවෙන් මෙම සම්පූර්ණ වෙනස සඳහාම සම්පූර්ණ සැසඳුමක් ඉදිරිපත් කිරීමේ ප්‍රායෝගික ගැටළුවක් තිබේ.

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල (රු.මි) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ස්ථාවර වත්කම් | 1,034.75 | ක්ෂේත්‍ර අංකය, මිලදී ගත් දිනය, පිරිවැය, වත්කම් ස්ථාපිත කර ඇති ස්ථානය ආදී මූලික තොරතුරු ඇතුලත් ස්ථාවර වත්කම් ලේඛන හා 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තා | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි පොදු උපදෙස් යටතේ, සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලයක් සකසා ඇති බැවින්, ස්ථාවර වත්කම් ලේඛනය හි පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය තවදුරටත් පවත්වාගෙන යෑම අනිවාර්ය නොවන බව සඳහන් කර ඇත. එබැවින් ඒ අනුව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | සියලුම ස්ථාවර වත්කම් සඳහා විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2011 අප්‍රේල් 29 දිනැති අංක 06/2011 දරන කම්කරු දෙපාර්මේන්තු චක්‍රලේඛයේ 2 වගන්තිය | කාර්යාලයට පැමිණිල්ලක් ලැබී දින 14 ක් ඇතුළත එය විභාග කිරීමට පියවර ගතයුතු වුවත්, මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට 2019, 2020 හා 2021 වර්ෂවලදී ලද පැමිණිලිවලින් පිළිවෙලින් පැමිණිලි 10 ක්, 48 ක් හා 47 ක්ද, 2022 මැයි විගණන දින වන විටත් විභාග කර අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට 2019, 2020 සහ 2021 වර්ෂවලදී ලද පැමිණිලිවලින් පිළිවෙලින් පැමිණිලි 10 ක්, 48 ක් හා 47 ක් දැනට විභාග වෙමින් පවතී. | පැමිණිලි සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතුකර සාමාජිකයින්ට ප්‍රශස්ථ සේවයක් ලබාදීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2007ඔක්තෝබර් 31දිනැති හා අංක 15/2007 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | | |
| (i) | 1.1 වගන්තිය | කම්කරු නිලධාරීන්ගේ අර්ධ මාසික චාරිකා වැඩ සැලසුම් එකී ආරම්භක දිනයට අවම වශයෙන් දින 3 කටවත් පෙර සහකාර කම්කරු කොමසාරිස් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී මඩකලපුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ කම්කරු නිලධාරීන් 7 දෙනෙකුට අදාල මාසික වැඩ සැලසුම් 36 ක් සඳහා එසේ අනුමැතීන් ලබාගෙන නොතිබුණි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් චාරිකා වැඩසටහන් ප්‍රමාද වී ඇත. දැනට චාරිකා වැඩසටහන් ලබාදෙන ලෙස උපදෙස් ලබාදී ඇති අතර සහකාර කම්කරු කොමසාරිස් විසින් අධීක්ෂණය කරනු ලැබේ. | චක්‍රලේඛවලට අනුගත වන ලෙස නිලධාරින් දැනුවත් කිරිම හා අධික්ෂණ කටයුතු සිදු කිරිම. |
| (ii) | 1.2 වගන්තිය | අනුමත චාරිකා වැඩ සටහන් සංශෝධනය කිරීමට අවශ්‍ය වේ නම් පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී මඩකලපුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සංශෝධිත වැඩසටහන් අතරින් සියයට 65 ක පමණ ප්‍රමාණයක් සඳහා එසේ පූර්ව අනුමැතීන් ලබාගෙන නොතිබුණි. | චාරිකා වැඩසටහන්වල මඟ හැරුණු රාජකාරි සඳහා පූර්ව අනුමැතිය ලබා ගන්නා ලෙසද ඔවුන්ගේ දින පොතෙහි ඊට හේතු දක්වන ලෙසද කම්කරු නිලධාරීන්ට උපදෙස් දී ඇත. | චක්‍රලේඛවලට අනුගත වන ලෙස නිලධාරින් දැනුවත් කිරිම හා අධික්ෂණ කටයුතු සිදු කිරිම. |
| (iii) | 2 වගන්තිය | මඩකලපුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අයත් බල ප්‍රදේශය තුල පිහිටි ලියාපදිංචි ආයතන 1554 ක් අතුරින් 964 ක් සම්බන්ධයෙන් කම්කරු නිලධාරීන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු වී නොතිබුණි. එබැවින් එම ආයතනවලින් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් අනුව දායක මුදල් ප්‍රේෂණය කරන්නේ ද යන්න පිළිබඳ සොයා බැලීමක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය. | කොවිඩ් 19 වසංගතය පවතිද්දී අවම වශයෙන් ආයතන 10 ක් පරික්ෂා කරන ලෙස කම්කරු නිලධාරීන්ට උපදෙස් දි ඇති අතර, දීර්ඝ කාලයක් තිස්සේ මඟ හැරුණු ආයතන උපරිම සංඛ්‍යාවක් පරික්ෂා කරන ලෙසද ඔවුන්ට වර්තමානයේ උපදෙස් දෙන ලදී. තවද, සහකාර කම්කරු කොමසාරිස් විසින් අධීක්ෂණ පද්ධතිය අනුව තෝරා දෙනු ලබන ආයතන 10 ක් පරික්ෂා කිරීමටද උපදෙස් ලබාදී ඇත. | ආයතන සම්බන්ධයෙන් අහඹු පරික්ෂාවක් සිදු කර සමාජිකයන්ට ප්‍රශස්ථ සේවාවක් සැපයිමට කටයුතු කිරිම. |
| (iv) | 3.1 වගන්තිය | කම්කරු නිලධාරීන් විසින් සිදුකරන සෑම පරීක්ෂණයකටම අදාල වාර්තා එදිනම හෝ එදිනට | කම්කරු නිලධාරීන් වෙතින් නිදහසට කරුණු විමසා ඇති අතර, ඔවුන්ගේ පිළිතුරු ලිපි | චක්‍රලේඛය පරිදි වාර්තා ලබා දෙන ලෙස අදාල නිලධාරීන් |

| | | | | |
|---|---|---|---|---|
| | | පසුව එළබෙන පළමුවන කාර්යාල දිනයේ දී භාරදිය යුතු වන අතර දින 07 ක් තුල භාර නොදෙන වාර්තා සම්බන්ධයෙන් ප්‍රමාදයට හේතු සහකාර කම්කරු කොමසාරිස් විසින් විමසිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී මඩකලපුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ පරීක්ෂණ අවස්ථා 61 කට අදාලව වාර්තා ඉදිරිපත් කිරීමට දින 20 සිට දින 268 ක කාලයක් ගත කර තිබුණි. | අනුව ප්‍රමාදයට හේතු වී ඇත්තේ නිරන්තර රට අගුළු ලෑම් සහ පැවති වසංගත තත්ත්වයයි. | දැනුවත් කිරීම හා අධීක්ෂණ කටයුතු විධිමත් කළ යුතු වීම. |
| (v) | 5.1 වගන්තිය | සෑම මාසයක් අවසානයේම සියලුම කම්කරු නිලධාරීන් විසින් එම මාසයට අදාල දින පොත ඊළඟ මාසයේ 10 වන දිනට ප්‍රථම සහකාර කම්කරු කොමසාරිස් වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී මඩකලපුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ නිලධාරීන්ගේ දිනපොත් ඉදිරිපත් කිරීම අවස්ථා 28 කදී සති 01 සිට සති 13 ක අතර කාලයක් ගත කර තිබූ අතර අවස්ථා 23 කදී සති 13 කට වැඩි කාලයක් ගතකර තිබුණි. | කම්කරු නිලධාරින් වෙතින් නිදහසට කරුණු විමසා ඇති අතර, ඔවුන්ගේ පිළිතුරු ලිපි අනුව ප්‍රමාදයට හේතු වී ඇත්තේ නිරන්තර රට අඟුළු ලෑම් සහ පැවති වසංගත තත්ත්වයයි. | චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි කටයුතු කිරීමට නිලධාරින් දැනුවත් කළ යුතු වීම. |
| (ඇ) | 1999 පෙබරවාරි 11දිනැති හා අංක 01/99 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛය | 2019 හා 2020 වර්ෂවලට අදාලව ආයතන පරීක්ෂණ කටයුතු සිදුකර අධිභාර හා දායක මුදල් අයකර ගැනීමේ ප්‍රථම නිවේදනය නිකුත් කිරීම සඳහා දින 20 සිට දින 534 ක් දක්වා වූ කාලයක් ගතවී තිබූ අවස්ථා 9 ක් ද, අවසන් නිවේදනය නිකුත් කිරීම සඳහා දින 20 සිට දින 91 දක්වා කාලයක් ගත වී තිබූ අවස්ථා 10 ක්ද මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාල සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද, අවස්ථා 21 කට අදාලව ප්‍රථම නිවේදන නිකුත් කර දින 153 සිට දින 965 දක්වා කාලයක් ගතව තිබුණද අවසන් නිවේදන නිකුත් කර නොතිබුණි. එසේම අවස්ථා 33 කට අදාලව කිසිදු නිවේදනයක් නිකුත් කර නොතිබුණි. තවද, | රට තුල පැවති කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් මේ ලෙස නිවේදන නිකුත් කිරීම කල් ගත වී ඇත. මැද කොළඹ දිස්ත්‍රික් කාර්යාලයට අදාලව දැනට පොදු සාක්ෂි ලේඛනයේ සම්පූර්ණ මුදල් ගෙවීම් 08 ක් හා නඩු පැවරීම් 02 ක් සිදුකර ඇති අතර, ඉතිරිය සඳහා නඩු පැවරීමට කටයුතු සිදුකරමින් පවතී. | දායක මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා නිවේදන ප්‍රමාදයකින් තොරව යැවීම තුලින් සමාජිකයින්ට ප්‍රශස්ථ සේවයක් ඉටු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | මඩකලපුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලය විසින් 2021 වර්ෂයේ දායක මුදල් හා අධිභාර අයකර ගැනිම සඳහා සේවායෝජක ආයතන වෙත ප්‍රථම නිවේදනය නිකුත් කිරිමට දින 21 සිට දින 181 ක් දක්වා වූ කාලයක් ගතකල අවස්ථා 51 ක් නිරීක්ෂණය විය. | | |
| (ඇ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වන වගන්තිය | යම් ආයතනයක සේවකයින්ට අදාල දායක මුදල් සෑම මාසයක් අවසාන වී එළඹෙන මාසයේ අවසාන දිනට පෙර අරමුදල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, මඩකලපුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල බල ප්‍රදේශයට අයත් ආයතන 41 කට අදාලව මාස 3 ත් වර්ෂ 21 ත් අතර කාලයක සිට දායක මුදල් ප්‍රේෂණය කර නොමැති බව සේවක අර්ථසාධක අරමුදල් දත්ත පද්ධතිය පරිශීලනය කිරීමේ දී නිරීක්ෂණය විය. | අදාල ආයතනවලට ගොස් නිසි පියවර ගන්නා ලෙස කම්කරු නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | සේවායෝජක සම්බන්ධයෙන් සිදුවන අහඹු පරික්ෂාවන් වැඩි කිරිම සහ විධිමත් කිරිම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 340,728 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 283,986 ක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.මිලියන 56,742 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මූල්‍ය උපකරණවල සාධාරණ අගය ගැලපීම මත හඳුනාගත් ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 36,817 කින් වර්ධනය වීමත්, අරමුදලෙහි පොළී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 16,269 කින් වර්ධනය වීමත් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විස්තරය | | 2021 වර්ෂය | 2020 වර්ෂය | ආදායම වැඩිවීම/ (අඩුවීම) | |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| (අ) පොළී ආදායම | | | | | |
| i. | භාණ්ඩාගාර බැඳුම්කර | 285,052 | 266,130 | 18,922 | 7.11 |
| ii. | භාණ්ඩාගාර බිල්පත් | 256 | 415 | (159) | (38.31) |
| iii. | ස්ථාවර තැන්පතු | 3,857 | 5,877 | (2,020) | (34.37) |
| iv. | ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් | 544 | 521 | 23 | 4.41 |
| v. | ණයකර- ලැයිස්තුගත | 3,153 | 3,601 | (448) | 12.44 |
| vi. | - ලැයිස්තුගත නොවූ | 816 | 863 | (47) | (5.45) |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) ලාභාංශ ආදායම - සාමාන්‍යය කොටස් | | | | |
| i. ලැයිස්තුගත | 4,057 | 2,451 | 1,606 | 65.52 |
| ii. ලැයිස්තුගත නොවූ | 2,628 | 466 | 2,162 | 463.95 |

ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී 2021 වර්ෂයේදී භාණ්ඩාගාර බැඳුම්කරවල හා ලැයිස්තුගත සමාගම්වල ණයකරවල ආයෝජනයෙන් ලද පොළී ආදායම පිළිවෙලින් සියයට 7.11 කින් හා 12.44 කින් වර්ධනය වී තිබුණි. එසේ වුවද, භාණ්ඩාගාර බිල්පත්වල හා ස්ථාවර තැන්පතුවල ආයෝජනයෙන් ලද පොළී ආදායම පිළිවෙලින් සියයට 38.31 කින් හා 34.37 කින් අඩු වී තිබුණි. කෙසේ වුවත්, අරමුදලෙහි සමස්ථ පොළී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 5.86 කින් වර්ධනය වී තිබුණි.

තවද, අරමුදලෙහි ලාභාංශ ආදායම සැලකීමේදී, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ලාභාංශ ආදායම සියයට 129.17 කින් වර්ධනය වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

-------------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අරමුදලේ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ .

| <u>අනුපාත</u> | **<u>2021</u>** | **<u>2020</u>** |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය (%) | 87.35 | 85.8 |
| සමාන්‍ය ආයෝජනය මත ප්‍රතිලාභ අනුපාතය (%) | 10.78 | 10.09 |
| සමාජික ශේෂය මත ප්‍රතිලාභ අනුපාතය (%) | 8.36 | 8.37 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------------

**3.1 හඳුනාගත් පාඩු**

-------------------

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අරමුදලේ සාමාජිකයන්ට නව හැඳුනුම්පත් නිකුත් කිරීම සහ නැවත ලියාපදිංචි කිරීමේ පරිගණක කටයුතු සඳහා කාඩ්පත් 15,000 ක් රු.මිලියන 12.61 කට 2008 වර්ෂයේදී මිලදී ගෙන තිබුණද, මෙම කාඩ්පත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. තවද, මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 17.67 ක් වැයකර මිලදී ගන්නා ලද යන්ත්‍ර 35 කින් 2 ක් අපහරණය කර තිබුණු අතර ඉතිරි යන්ත්‍ර 33 සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | දීප ව්‍යාප්තව සවි කර ඇති යන්ත්‍ර නැවත ප්‍රධාන කාර්යාලයට රැස් කර ප්‍රයෝජනයට ගත හැකි කොටස් භාවිතයට ගැනීමට නිර්දේශ කරන ලද අතර මේ වන විට එම යන්ත්‍ර ප්‍රධාන කාර්යාලය වෙත රැස් කරමින් පවතී. ඉදිරි කාලය තුළ ඒවායේ ප්‍රයෝජනයට ගත හැකි කොටස් අවශ්‍යතාවය පවතින කාර්යාල හඳුනාගෙන එම කාර්යාල වෙත බෙදා හැරීමට කටයුතු කරනු ලැබේ. | මනා සැලැස්මක් හා අධ්‍යයනයක් සහිතව ව්‍යාපෘති ආරම්භ කළ යුතු වීම හා සාමාජික අරමුදලින් වියදම් දැරීමේදී ඵලදායී ලෙස වියදම් දැරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අරමුදලේ සාමාජිකයන්ගේ දත්ත පරිගණකගත කිරීම හා පරිලෝකනය කිරීම සම්බන්ධයෙන් බාහිර පාර්ශවයක් සමඟ ගිවිසුම්ගතව තිබුණි. මධ්‍යම ලිපිගොනු අංශය මගින් ගණනය කරනු ලබන දත්ත පරිගනකගත කිරීමේ දී හා පරිලෝකනය කිරීමේ දී යන අවස්ථා දෙකෙහිදීම සිදුවන දෝෂ ප්‍රතිශතයට අදාල දඩය මාසයට අදාල සම්පූර්ණ ඉන්වොයිසියේ වටිනාකමින් අඩු කරනු වෙනුවට දෝෂ ප්‍රතිශතය එක් මසකට ලබා දෙන ඉන්වොයිසි දෙකෙන් එකකින් පමණක් අඩුකර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දී ගිවිසුම් ප්‍රකාරව අඩු කල යුතු දඩය රු.175,684 ක් අඩුවෙන් ගණනය කර තිබූ බව නිරීක්ෂණය විය. | බාහිර ආයතනය මගින් සිදුවන දෝෂ පරීක්ෂා කොට දත්ත පරිගණක ගත කිරීමේ දෝෂ වේ නම් අදාල දෝෂ ප්‍රතිශතය, දත්ත පරිගණක ගත කිරීම සඳහා ඉදිරිපත් වන ඉන්වොයිසිය මඟින් ද පරිලෝකනයට අදාල දෝෂ ඊට අදාල බිල්පත් මඟින්ද ඒ ඒ මාසයන්හිදී අඩුකිරීමට වවුචරය සමඟ සඳහන් කොට ගෙවීමට ඉදිරිපත් කරනු ලබයි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතු විම. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම් 11 ක සිදුකර තිබූ රු.මිලියන 7,386 ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් සඳහා හා 2019, 2020 හා 2021 යන වර්ෂයන් 3 හිදීම ලාභාංශ ආදායම් ලැබී නොතිබුණි. මෙම සමාගම් 11 න් සමාගම් 2 ක පමණක් සිදුකර තිබූ ආයෝජනය රු.මිලියන 3,410.57 ක් විය. | මින් සමාගම් 6 ක් සංචාරක ව්‍යාපාරය හා බැඳුණු සේවා සපයන ආයතන වන අතර, ජාතික හා ජාත්‍යාන්තර සංචාරක සීමා කිරීම් හමුවේ එම ආයතනයන්හි මෙහෙයුම් ක්‍රියාකාරිත්ව අතිශයින් අඩාල වූ අතර, බොහෝ ආයතන මෙහෙයුම් අලාභ වාර්තා කර තිබුණි. ඒ අනුව එකී සමාගම්වලට ලාභාංශ ප්‍රකාශ කිරීමට හැකියාවක් නොතිබුණි. | ආයෝජනයන් සිදු කිරිමේදි සමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කිරිම. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ලැයිස්තුගත සමාගම් 08 ක සිදුකර තිබූ රු.මිලියන 9,486.07 ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් සඳහා 2021 වර්ෂයේදී ලාභාංශ ආදායම් ලැබී නොතිබුණි. | 2020-2021 වසරවලදි කොවිඩ් - 19 වසංගතයෙහිද, එමඟින් ජාතික හා ජාත්‍යන්තර තලයේ සිදු වූ ආර්ථික ගැටළුවල බලපෑම ලෙස දේශීය ආර්ථිකයේ සිදුවූ විශාල සංකෝචනයෙහිද ඒකාබද්ධ බලපෑම මෙම සමාගම්වලටද බලපෑ බැවින්, එම ව්‍යාපාරවල විශාල කඩාවැටීමක් සිදු වූ බවත්, අදාළ සමාගම් නොවසා පවත්වාගෙන යාමට සැලකිය යුතු ප්‍රයත්නයක් දැරූ බවත්, අපගේ නිරීක්ෂණයයි. | ආයෝජනයන් සිදු කිරිමේදි සමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කිරිම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2010 වර්ෂයේ දී ගුවන් සමාගමක සිදුකරන ලද රු.මිලියන 500 ක ආයෝජන සඳහා අදාල ආයෝජන කරන ලද අවස්ථාවේ සිටම කිසිදු ආදායමක් අරමුදලට ලැබී නොතිබුණි. | මෙම ආයෝජනයෙහි වර්තමාන අගය හානිපූර්ණය කිරීමෙන් අනතුරුව රු.100 ක් ලෙස ගිණුම් ගත කොට ඇත. මෙය මුළුමනින්ම පාහේ රජයේ හිමිකාරිත්වය යටතේ පවතින සමාගමක් වන අතර, දිගින් දිගටම පාඩු ලැබීම හේතුවෙන් රජය විසින් භාණ්ඩාගාර හරහා ලබාදෙන ලද මූල්‍ය ප්‍රතිපාදන මත පවත්වාගෙන යන සමාගමකි. | ආයෝජනයන් සිදු කිරීමේදි සමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කිරීමට කටයුතු කල යුතු වීම. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දින වන විට “ද ෆිනෑන්ස් සමාගමෙහි” බලපත්‍රය අවලංගු කිරීම හේතුවෙන් අරමුදලට රු.මිලියන 205.49 ක් අහිමි වී තිබුණි. | සමාගම ඇවර කිරීමකදී, අරමුදලට එහි ආයෝජනය හෝ කොටසක්, ඉතිරි වටිනාකම ලෙස ලැබිය හැකිය. | ආයෝජනයන් සිදු කිරීමේදි සමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කිරීමට කටයුතු කල යුතු වීම. |
| (ඉ) | අරමුදල විසින් 2021 වර්ෂයේ දී සිදුකරන ලද සාමාන්‍ය කොටස් විකුණුම්වලින් සමාගම් 05 ක සිදුකර තිබූ සාමාන්‍ය පිරිවැය රු.මිලියන 93.39 ක් වූ කොටස් අලෙවියෙන් රු.මිලියන 53.76 ක ප්‍රාග්ධන අලාභයක් ලබා තිබුණි. | ලැයිස්තුගත කොටස් ආයෝජන පහක මිල ගණන් සමස්ථ කොටස් මිල දර්ශකය වැඩි වුවද, දිගින් දිගටම බර තබන ලද පිරිවැයට වඩා අඩු මට්ටමක පැවති බැවින්, ඒවායේ මිල ගණන් තවදුරටත් ඉහළ යෑමේ ප්‍රවණතාවයක් නැති බව තක්සේරු කිරීමෙන් අනතුරුව, මුදල් මණ්ඩලයේ අනුමැතිය පරිදි එවකට වෙළඳපොළ පැවති මිල ගණන්වලට විකුණන ලදී. | සමාජිකයන්ට ඉහල ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ආයෝජන කළමනාකරණය කළයුතු වීම. |
| (ඊ) | ලැයිස්තුගත නොවූ සමාගම්වල කොටස් ආයෝජනයෙන් රු.මිලියන 5000 ක් එනම් සියයට 53 ක් 2013 වර්ෂයේ දී කැන්විල් හෝල්ඩින්ග්ස් හෝටල් සංකීර්ණය ඉදිකිරීම සඳහා ආයෝජනය කර තිබූ අතර එම හෝටල් සංකීර්ණය ඉදිකිරීමට අදාල ග්‍රෑන්ඩ් හයිට් කොළඹ ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කටයුතු 2020 ජූලි මාසයේදී නැවත ආරම්භ කලද ඊට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලින් සිදු කිරීමටත් මූල්‍ය අවශ්‍යතා රැස් කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය බලතල ලබා දීම 2022 ජනවාරි 04 දිනැති අංක 21/2278/306/100 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සිදුකර තිබුණි. ඒ අනුව සැලසුම් කල අයුරින් 2021 දෙසැම්බර් 27 වන විටත් හෝටල් සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු සිදුකර නොතිබුණි. එබැවින් උක්ත ආයෝජනය සිදු කර වර්ෂ 8 ක කාලයක් ගතවී තිබුණද මෙම ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් අරමුදලට ලැබී නොතිබුණි. | ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ඉදිකිරීම් නැවත ආරම්භ කිරීම සඳහා තීරණය කොට තිබුණද, ඊට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ හා විදේශ විනිමය ලබා ගැනීමේ ගැටළු පැවතුනු අතර, ඒ හේතුවෙන් විදේශ ආයෝජන ලබාගැනීම සඳහා 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී සමාගම විසින් ආයෝජන යෝජනා කැඳවා තිබුණි. අනතුරුව, කොටස් හා ණය ආයෝජනය කිරීමට කැමැත්ත පලකොට තිබූ විදේශීය සමාගමකට ඒ සඳහා අනුමැතිය, 2022 ජනවාරි 04 දිනදී ලබාදී තිබුණි. නමුත්, දැනට රටේ පවතින විදේශ විනිමය අර්බුදය හා ආර්ථික තත්ත්වයන් යටතේ එම යොජනාව තවදුරටත් ඉදිරියට ගෙන යැමට අදාළ විදේශ ආයෝජක සමාගම අකමැත්ත පලකර තිබීම | ආයෝජනයන් සිදු කිරීමේදි සමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි අවධානම අවම වන ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | | හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ඒ අනුව, ග්‍රෑන්ඩ් හයට් හෝටල් සංකීර්ණය මුළුමනින්ම විකුණා දැමීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතින බවද අදාළ සමාගම විසින් දන්වා ඇත. ඒ අනුව නොබෝ දිනකදී මෙම ආයෝජනය උපලබ්ධි කරගැනීමට හැකි වෙතැයි බලාපොරොත්තු වේ. | |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට කොටස් වෙළඳපොළෙහි සිදුකරන ලද රු.මිලියන 84,067 ක් වූ සමස්ත ආයෝජනයෙන් රු.මිලියන 9,681 ක් හෙවත් සියයට 12 ක් හෝටල් ක්ෂේත්‍රයෙහි සමාගම් 11 ක ආයෝජනය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) | මෙම ආයෝජනයන්හි 2021 දෙසැම්බර් 31 දිනට වෙළඳපොළ අගය රු.මිලියන 2,659.51 කින් අඩු වී තිබුණි. | 2019 – 2021 කාල පරිච්ඡේදය තුළදී ජාතික හා ජාත්‍යාන්තර සංචාරක සීමා කිරීම් හමුවේ එම ආයතනයන්හි මෙහෙයුම් ක්‍රියාකාරිත්ව අතිශයින් අඩාල වූ අතර, බොහෝ ආයතන මෙහෙයුම් අලාභ වාර්තා කර තිබුණි. | ආයෝජනයන් සිදු කිරීමේදි සමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කිරිම. |
| (ii) | හෝටල් ක්ෂේත්‍රයෙහි කරන ලද ආයෝජන 2019 හා 2020 වර්ෂ අවසානයේදී රු.මිලියන 10,084.28 ක්ද, 2021 වර්ෂය අවසානයේදී රු.මිලියන 9,681.52 ක් ද වූ අතර මෙම ආයෝජන සඳහා 2021 වර්ෂයේ දී කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. 2019 හා 2020 වර්ෂවලදී මෙම ආයෝජන මත ලද ප්‍රතිලාභය පිළිවෙලින් රු.මිලියන 103.18 ක් හා රු.මිලියන 47.40 ක් හෙවත් සියයට 2.47 ක් හා සියයට 0.98 ක් විය. තවද, සමාගම් 7 ක සිදුකර තිබූ රු.මිලියන 3,174.54 ක ආයෝජන සඳහා 2020 හා 2019 වර්ෂවලදී ද කිසිදු ප්‍රතිලාභයක් ලැබ් නොතිබුණි. | 2019 – 2021 කාල පරිච්ඡේදය තුළදී ජාතික හා ජාත්‍යාන්තර සංචාරක සීමා කිරීම් හමුවේ එම ආයතනයන්හි මෙහෙයුම් ක්‍රියාකාරිත්ව අතිශයින් අඩාල වූ අතර, බොහෝ ආයතන මෙහෙයුම් අලාභ වාර්තා කර තිබුණි. | ආයෝජනයන් සිදු කිරීමේදි සමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කිරිම. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල පරිගණක ජාලයේ බිඳ වැටීමකින් තොරව පවත්වා ගැනීමට අවශ්‍ය නඩත්තු හා සේවා කිරීම් නිසි කලට කලයුතු වුවත්, 2015 සිට 2020 දක්වා කාලපරිච්ඡේදයේදී අවස්ථා 6 කට අදාලව එසේ ගිවිසුම්ගත කාලය අවසන් වී තිබුණද, නැවත ගිවිසුම්ගත නොවූ අවස්ථා නිරීක්ෂණය විය. | 2021 වර්ෂය සම්බන්ධයෙන් සැලකීමේ දී රටපුරා ව්‍යාප්ත වූ කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් නඩත්තු හා සේවා සිදුකිරීමට අදාළ ආයතන තෝරා ගැනීමේ ප්‍රායෝගික අපහසුතාවයන් පැන නැගීම | ගිවිසුම් කාලය අවසන් වූ ගිවිසුම් සඳහා නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | තවද, නඩත්තු සේවා ලබා ගැනීමේදී පවත්නා ආයතනය වෙනුවට නව ආයතනයක් තෝරා ගැනීමටත්, එහිදී විශේෂඥ දැනුමැති පුද්ගලයන්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයීමේ කමිටුවක් පත් කිරීමටත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබූ නමුත් Monitoring System හා Pseries Services සම්බන්ධයෙන් එසේ සිදු කිරීමකින් තොරව දිගින් දිගටම ගිවිසුම් කාලය දීර්ඝ කරමින් පෙර ලබාදී තිබූ ආයතනයටම නඩත්තු සේවා කටයුතු ලබාදී තිබුණි. | හේතුවෙන් ගිවිසුම්ගත වීම් සිදු නොවූ බවද වැඩිදුරටත් සඳහන් කරමි. | |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ සාමාජික අරමුදල තුල කම්කරු කොමසාරිස් නමින් පැවති ගිණුමේ සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් දෙපාර්තමේන්තුව විසින් අයකරගෙන තිබූ රු.මිලියන 11,456 ක් වූ මුදල සහ එසේ නඩු පැවරීමෙන් අයකරගෙන නිරවුල් කරන තුරු පොදු තැන්පතු ගිණුමක රඳවාගෙන තිබූ රු.මිලියන 301 ක් වූ මුදල එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, සේවායෝජකයින්ගේ නමින් වෙන් වෙන්ව පවත්වාගෙනයනු ලබන "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01" ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 70,832 ක ශේෂයක් අදාළ සාමාජිකයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම, 2021 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් රු. මිලියන 956 ක් ද, ඌන/අතිරික්ත දායක මුදල් වශයෙන් රු.මිලියන 2,117 ක් ද ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් රු.මිලියන 353 ක් ද සාමාජික අරමුදල යටතේ දක්වා තිබුණද එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.<br><br>ඉහත සඳහන් සාමාජික ගිණුම්වලට බැර නොකර පවතින ගිණුම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස 2013, 2016 හා 2017 වර්ෂවලදී රාජ්‍ය ගිණුම් කාරක සභා මඟින්ද නියෝග කර තිබුණි. | කොවිඩ් - 19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් දිස්ත්‍රික් කාර්යාල වෙතින් තොරතුරු ගෙන්වා ගැනීමේ ප්‍රමාදයන් සිදුවීමද, සේවායෝජක පාර්ශවයෙන් ප්‍රමාණවත් සහයෝගයක් නොලැබීමද මෙම ප්‍රමාද වීම කෙරෙහි බලපාන ලදි. ඉදිරියේ දි කම්කරු දෙපාර්තමේන්තුව විසින් දායක මුදල් කේවල ගිණුම් ගත කිරීම හා අදාළ නිවැරදි “සී” වාර්තා පමණක් යොමු කිරීම, අඩුපාඩු සහිත හරවා යවනු ලැබූ “සී” වාර්තා සංශෝධනය කර හැකි ඉක්මණින් ගිණුම් වර්ෂය තුළම යොමු කිරීම හා සමානුපාතික ක්‍රමවේදය යටතේ “සී” වාර්තා ඉදිරිපත් කිරීමට කම්කරු කාර්යාල යොමු කිරීම මත මෙම ගිණුමේ නිරවුල් නොවූ ශේෂයන් එක්රැස් වීම ක්‍රමයෙන් අඩු වී යනු ඇතැයි අපේක්ෂා කෙරේ. | නිරවුල්කර නොමැති දායක මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කාර්යක්ෂම වැඩ පිළිවෙලක් සකස් කිරීමට කටයුතු කළ යුතු වීම |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මෙහෙවර පියසෙහි පිහිටි අරමුදලේ කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර නිර්මිත සැකසීමේ කාර්යය වෙනුවෙන් 2020 වර්ෂයේ දී මුලු ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.මිලියන 135.3 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණු නමුත් 2022 අප්‍රේල් 30 දින වන විටත් අභ්‍යන්තර නිර්මිත සැකසීමේ කටයුතු සිදුකර නොතිබුණි. | සේවක අර්ථසාධක අරමුදල් අංශයේ අභ්‍යන්තර නිර්මිතය සැකසීමේ කොන්ත්‍රාත්තුවට අදාල ගෙවීම් ප්‍රසම්පාදන කමිටු තීරණ හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉල්ලීමත්, ඉංජිනේරු (සිවිල්) ගේ නිර්දේශය අනුවත් සිදුකර ඇති අතර මෙම අභ්‍යන්තර නිර්මිත සැකසීමේ කාර්යය මේ වන විටත් ආරම්භ කර අදාල නිර්මිත කටයුතු සිදුවෙමින් පවතී | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කරමින්ද, අරමුදල් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් උපයෝජනය කරමින්ද ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වීම. |